# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1958/25 - 2016 මාර්තු මස 17 වැනි බ්‍රහස්පතින්දා - 2016.03.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනත

57 වැනි වගන්තිය යටතේ නියෝගය

1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනතේ 57 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍ය, රංජිත් සියඹලාපිටිය වන මම ලංකා විදුලිබල මණ්ඩලයට අවශ්‍ය වී ඇති මෙහි උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම් අත්පත් කර ගැනීමේ යෝජනාව මෙම නියෝගය මගින් අනුමත කරමි.

රංජිත් සියඹලාපිටිය,
විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍ය.

2016 මාර්තු මස 16 වැනි දින.

උපලේඛනය

ශ්‍රී ලංකාවේ සබරගමුව පළාතේ, කෑගල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ, දෙහිගම්පල කෝරළයේ යටියන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ අංක 134 D දරන කළුකොහුතැන්න ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ කළුකොහුතැන්න ග්‍රාමයේ පිහිටියා වූ ද, ලංකා විදුලිබල මණ්ඩලය මගින් පිළියෙල කරන ලද අංක BHP 001 දරන 2016.02.26 දිනැති දළ සැලැස්මෙහි කැබලි අංක 01 ලෙස පෙන්නුම් කර ඇති පරිදි මායිම් වූ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.1265 (පර්චස් 50) ක් වූ ඉඩමට හා අංක BHP 002 දරන 2016.02.26 දිනැති දළ සැලැස්මෙහි කැබලි අංක 02 ලෙස පෙන්නුම් කර ඇති පරිදි මායිම් වූ ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.5691 (අක්කර 01 රූඩ් 01 පර්චස් 25) ක් වූ ඉඩමට මායිම් පහත දැක්වෙන පරිදි වේ.

1. කැබලි අංක 01 - ස්ථිර ගොඩනැගිල්ලක් සහිත ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.1265 (පර්චස් 50) ක් වූ ඉඩම

| | | |
|---|---|---|
| *උතුරට* | : | අවිස්සාවේල්ල - හැටන් ප්‍රධාන මාර්ගය ; |
| *නැගෙනහිරට* | : | අදාළ නොවේ ; |
| *දකුණට* | : | පොකුණුවල ගම්මානයට යන මාර්ගය ; |
| *බටහිරට* | : | අදාළ නොවේ. |
| හිමිකම් කියන අය | : | නොදනී |

2. කැබලි අංක 02 - ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.5691 (අක්කර 01 රූඩ් 01 පර්චස් 25) ක් වූ ඉඩම

| | | |
|---|---|---|
| *උතුරට* | : | ගම්සභා පාර ; |
| *නැගෙනහිරට* | : | කැළණි ගඟ ; |
| *දකුණට* | : | කැළණි ගඟ ; |
| *බටහිරට* | : | ගම්සභා පාර. |
| හිමිකම් කියන අය | : | නොදනී |

1A - G 23141 — 56 (2016/03)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


BHP-001
N
FROM AVISSAWELLA
TO HATTON
40Km
A7 Road
Ch. 39+800
house
wirepole
wirepole
wirepole
BLOCK No. 01
AREA – 50 Perch
WELL
POKUNUWALA VILLAGE
CEYLON ELECTRICITY BOARD
BROADLANDS HYDROPOWER PROJECT
DATE
26/02/2016
SCALE
N/A
DRAWING No.
BHP-001
APPROVED
TITLE:
DRAWN
Sandaruwan
POWER HOUSE ACCESS ROAD






ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.